# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,722 — 1966 නොවැම්බර් 18 වැනි සිකුරාදා — 1966.11.18

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# II වැනි කොටස — අධිකරණ

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| සම්මත වූ පනත් | — | පිස්කල් විකිණීම් පිළිබඳ දැන්වීම | 159 |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම | — | මුදල් නඩු පිළිබඳ දැන්වීම | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන | 159 | නීති අධ්‍යාපන සභාවේ දැන්වීම | — |
| දිස්ත්‍රික් උසාවිවල හා ඊට පහළ උසාවිවල දැන්වීම | — | නොතාරිස් ලැයිස්තුව | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම | — | විවිධ දැන්වීම | — |
| පිස්කල් මාර්ෂල්වරුන් පත් කිරීම | — | | |


සැලකිය යුතුයි.—1964 ජනවාරි සිට ජූනි 30 දක්වා නිකුත් අංක 13,898 සිට 14,088 තෙක් ඇති ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රිකාවන්ට සූචියක් මෙම ගැසට් පත්‍රයට අතිරේකයක් වශයෙන් පලවේ.

## ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන

### ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ අධිකරණ වාර

උසාවි ආඥාපණතේ 26 වැනි ඡේදයෙන් මා වෙත පැවරී බලයෙන්, අග්‍රවිනිශ්චයකාර ධුරන්ධර මිලියානි ක්ලෝඩ් සන්සෝනි වන මම, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර මණ්ඩලයේ අදහස් විමසා එයට සැහෙන කරුණු පෙනී, ශ්‍රේෂ්ඨාධිකරණයේ මැදරට චාරිකාව සඳහා 1966 දෙසැම්බර් මස 1 වැනි බ්‍රහස්පතින්දා සිට මහනුවරදී පැවැත්වීමට නියමිත අපරාධ අධිකරණ වාරයට අමතරව, එදින සිට කුරුණෑගලදී තවත් අපරාධ අධිකරණ වාරයක් පැවැත්වීමට නියෝග කරමි.

ඇම්. සී. සන්සෝනි,
අග්‍රවිනිශ්චයකාර.

1966 නොවැම්බර් මස 8 වැනි දින,
කොළඹ දී ය.

11-686

## පිස්කල් විකිණීම් පිළිබඳ දැන්වීම්

## දකුණු පළාත

### කළුතර දිස්ත්‍රික් නඩු ශාලාවේදීය

කලුතර, පලාතොට පදිංචි ඒ. ඊ. ඩබ්ලිව්. ප්‍රැන්කෝ මහත්මී .......................................................... පැමිණිලිකාරයා.

නොම්මරය ඇම්. ආර්. 1056.

එදිරිව

කලුතර, සෝමසිරි ස්ටෝර්ස් හි, අංක 866 දරන ස්ථානයේ පදිංචි එච්. ඩී. ජේ. පෙරේරා ............................. විත්තිකාරයා.

මෙහි පහත සඳහන් වෙන දේපලවලින් ඉහත කී නඩුවේ විත්තිකරුට තිබෙන අයිතිවාසිකම් සහ ප්‍රයෝජනයත් වර්ෂ 1966 ක්වූ දෙසැම්බර් මස 13 දින පෙරවරු 10.30ට එම ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්නට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ.

ඉඩම විකුණනු ලබන්නේ රුපියල් දාහක්, පිස්කල් ගාස්තු හා පවුන්ඩේජ් ගාස්තු අයකර ගැනීමටය.

සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පලකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ

**විශේෂ නිවේදනයයි**

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථොක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් එය එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1966 ජූලි මස 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

### උපලේඛනය

බස්නාහිර පලාතේ, කලුතර දිස්ත්‍රික්කයේ, කලුතර තොටමුනේ, කලුතරබද්දේ, පලාතොට පිහිටි කලාසියාගොඩැල්ලවත්ත නොහොත් කලාසියාගොඩැල්ල නමැති ඉඩමේ අංක 16 දරන කට්ටියට මායිම්— උතුරට පාරද, නැගෙනහිරට පාරද, දකුණට මෙම ඉඩමේ අංක 21 දරන කට්ටිය හා බස්නාහිරට, මෙම ඉඩමේ අංක 17 දරන කට්ටිය යන මායිම්තුල ඇති ඉඩම් ප්‍රමාණය පර්චස් තිස්තුනක් පමණවේ. (අ. 0, රූ. 0, ප. 33).

මූ. සී. බූ. පීරිස්,
කලුතර නියෝජ්‍ය පිස්කල් වෙනුවට.

වර්ෂ 1966 නොවැම්බර් මස 7 වැනිදා,
කලුතර පිස්කල් කන්තෝරුවේ දී ය.

11-635

---

## කළුතර දිස්ත්‍රික් නඩු ශාලාවේදීය

ඉඳුරුවේ, අතුරුවැල්ලේ පදිංචි කිරිබංඩා මකුලොලුව...පැමිණිලිකාරයා.

නොම්මරය ඇම්. බී/607. එදිරිව

වලගෙදර පදිංචි අයිසැක් ඩයස් ජයසිංහ .............. විත්තිකාරයා.

මෙහි පහත සඳහන් වෙන දේපලවලින් ඉහත කී නඩුවේ විත්තිකරුට තිබෙන අයිතිවාසිකම සහ ප්‍රයෝජනයත් වර්ෂ 19්6 ක් වූ දෙසැම්බර් මස 17 දින පෙරවරු 10.30ට එම ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ.

ඉඩම විකුණනු ලබන්නේ රු. 3,500 ක් හා එම මුදලට 66.2.25 දින සිට සම්පූර්ණයෙන් ගෙවනතෙක් සියයට 5 පොලිය, පිස්කල් ගාස්තු හා පවුන්ඩේජ් ගාස්තු අයකර ගැනීමටය.

### උපලේඛනය

බස්නාහිර පලාතේ, කලුතර දිස්ත්‍රික්කයේ, නැගෙනහිර පස්දුන් කෝරලේ, දකුණු මහ පත්තුවේ පැලවත්තේ පිහිටි කනත්තෙ ගොඩවත්ත නමැති ඉඩමේ, බිමෙන් හා ගහකොලින් නොබෙදූ 1/18 + 2/6 පංගුවක් හා එහි තිබෙන අංක 5 ලෙස ලකුණුකල දැනට නව නගරසිරි හෝටලය නමැති සම්පූර්ණ ගොඩනැගිල්ල. එකී ඉඩමට මායිම් :—උතුරට : අංක 10588 දරන මූලික සැලැස්මේ පෙන්වන අංක 32 දරන කට්ටිය; නැගෙනහිරට: අංක 10588 දරන මූලික සැලැස්මේ පෙන්වන අංක 32 හා 35 දරන කට්ටිද; දකුණට හා බස්නාහිරට: අංක 10588 දරන මූලික සැලැස්මේ පෙන්වන අංක 32 දරන කට්ටිය. අංක 212207 දරන හිමිකම් පිඹුරේ අනුව ඉඩම් ප්‍රමාණය අක්කර එකයි, පර්චස් තිස් එකක් වේ. (අ. 1, රූ. 0, ප. 31) හා දැනට මායිම් :—උතුරට : එකී අංක 32 දරන කට්ටිය ; නැගෙනහිරට : අංක 32 හා 35 දරන කට්ටි ; දකුණට හා බස්නාහිරට : පාර හා අංක 32 දරන කට්ටිය. බලයලත් මානකතෘනවන වී. ඇප්. කොලට් මහතා සකස් කල අංක 4565 හා 45.9.13 දින දරන පිඹුරු පත අනුව ඉඩම් ප්‍රමාණය අක්කර එකයි, රූඩ් එකයි, පර්චස් එකලොහක් වේ. (අ. 1, රූ. 1, ප. 11).

ස. ද. සී. විතාරණ,
කලුතර නියෝජ්‍ය පිස්කල් වෙනුවට.

වර්ෂ 1966 නොවැම්බර් මස 6 වැනිදා,
කලුතර පිස්කල් කන්තෝරුවේ.

11-634

---

## කළුතර දිස්ත්‍රික් නඩු ශාලාවේදීය

ගම්පහ අංක 51 දරන, කුවින් මේරි පාරේ, සී. කිවු. සූරියබණ්ඩාර ............................................................ පැමිණිලිකාරයා.

නොම්මරය එම්.එස් /118 එදිරිව

දකුණු කලුතර අංක 35 දරන ඇඩම් වීථියේ දෙවරකොට්ටගේ පීටර් කාරියවසම් ..................................විත්තිකාරයා.

මෙහි පහත හඳහන් වෙන දේපලවලින් ඉහත කී නඩුවේ විත්තිකරුට තිබෙන අයිතිවාසිකම් සහ ප්‍රයෝජනයත් වර්ෂ 1966 ක්වූ දෙසැම්බර් මස 12 දින පෙරවරු 10.30ට එම ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ.

ඉඩම් විකුණනු ලබන්නේ, රුපියල් අටදාස්හයසිය අනූ එකක් (රු. 8,691 ක්), රුපියල් හත්දාහට (රු. 7,000 ට), 63.9.2 දින සිට 1964.2.11 තෙක්, 10% පොලිය සහ එම එකතු මුදලට ගෙවනතෙක්, නීත්‍යානුකූල පොලිය හා රුපියල් පන්සිය දහතුනක් හා ශත එකොලහයි භාගයක් (රු. 513.11½) නඩු ගාස්තු, පිස්කල් ගාස්තු හා පවුන්ඩේජ් ගාස්තු අයකර ගැනීමටය.

### උපලේඛනය

1. බස්නාහිර පලාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, බස්නාහිර පස්දුන් කෝරලේ ඉද්දගොඩ පත්තුවේ හේනෙගම පිහිටි මැණික්ගොඩකුරුඳුවත්තේ අංක 10 දරන කට්ටියට මායිම් :—උතුරට : මෙම ඉඩමේ අංක 1, 9, 6 සහ 5 දරන කට්ටි ; නැගෙනහිරට : මැණික්ගොඩ ඇල, වී. පී. 264540. මැණික්ගොඩකුරුඳුවත්ත වී. පී. 279485, අංක 15 දරන කට්ටිය සහ මැණික්ගොඩකුරුඳුවත්තේ පිටකට්ටිය ; දකුණට : ඇල සහ බත්දතේවෙල නොහොත් බත්දතේකුඹුර ; බස්නාහිරට : බත්දතේවෙල නොහොත් බත්දතේකුඹුර, වතුර පාර, අංක 14 දරන කට්ටිය සහ කරත්ත පාර. මෙකී මායිම් තුල ජේ. ජී. ද සිල්වා මානකතෘන සකස්කල අංක 1327 දරන මානක සැලැස්ම අනුව ඉඩම් ප්‍රමාණය අක්කර විසිහතරයි, රූඩ් දෙකයි, පර්චස් දහයක්වේ. (අ. 24, රූ. 2, පර්. 10) මෙම ඉඩම කළුතර ඉඩම් ලියා පදිංචිකිරීමේ කාර්යාලයේ අංක සී. 13්/5 යටතේ ලියා පදිංචි කර ඇත.

2. ඉහත කී හේනෙගම පිහිටි මැණික්ගොඩකුරුඳුවත්තෙ අංක 3 දරන කට්ටියට මායිම් :—උතුරට : මෙම ඉඩමේ අංක 3 දරන කට්ටිය ; නැගෙනහිරට : කරත්ත පාර ; දකුණට : අංක 11 දරන කට්ටිය ; බස්නාහිරට : මැණික්ගොඩවත්ත. මෙකී මායිම් තුල පිහිටි අංක 1327 දරන මානක සැලැස්ම අනුව ඉඩම් ප්‍රමාණය අක්කර එකයි පර්චස් තිස් හයක්වේ. (අ. 1, රූ. 0, ප. 36), මෙම ඉඩම කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක 133/4 යටතේ ලියා පදිංචිකර ඇත.

ස. ද. සී. විතාරණ,
කළුතර නියෝජ්‍ය පිස්කල් වෙනුවට.

වර්ෂ 1966 නොවැම්බර් මස 5 වැනිදා,
කළුතර පිස්කල් කන්තෝරුවේ දී ය.

11-1279

---

# වයඹ පලාත

## කුරුණෑගල දිස්ත්‍රික් නඩු ශාලාවේ දී ය

පොතුහැර දඹදෙනි මාවතගම විවිධසේවා සමුපකාර සමිතිය..............................................................පැමිණිලිකාරයා.

නොම්මරය 2438/ඇම්. එදිරිව

පොතුහැර කොට්ටගහලියද්ද බී. ඇම්. පුංචිබණ්ඩා...වගඋත්තරකරු.

මෙහි පහත සඳහන් වෙන දේපළවලින් ඉහත කී නඩුවේ වග උත්තරකරුට තිබෙන අයිතිවාසිකම් සහ ප්‍රයෝජනයත් වර්ෂ 1966 ක්වූ දෙසැම්බර් මස 16 දින පස්වරු 3 ට පළමුවෙනි ඉඩමෙන් පටන්ගෙන පිළිවෙලින් එකී ඉඩම් වලදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ.

1. වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ දඹදෙනිහත්පත්තුවේ උඩපොල මැදලස්සේ කොරළේ මාවතගම පිහිටි රතුඅඹේහේන කුරක්කන් ලාස් 5 ක වපසරියට මායිම් :—උතුරට : බණ්ඩිරාලගේ කුඹුරේ අගලද ; නැගෙනහිරට : බඩවැටිය සහ කුඹුරු වෙන්වන ඉමේ අගලද ; දකුණට : නිකගොල්ලේහේන සහ බස්නාහිරට : අප්පුහාමිගේ හේනේ ඉමද ; යන මායිම් තුළ පිහිටි ඉඩමෙන් නොබෙදූ දෙකෙන් පංගුව.

2. එම ගම පිහිටි කොට්ටගහලියද්ද කුඹුරේ උතුරුපැත්තේ කැබැල්ලේ වී දෙපැලක වපසරියට මායිම් :—උතුරට : මුදියන්සේගේ සහ තවත් අයගේ වත්තද ; නැගෙනහිරට : නිලමේරාලගේ කුඹුරේ ඉන්නියරද ; දකුණට : මෙම කුඹුරේ ඉතිරි වී දෙපැලේ ඉමද ; බස්නාහිරට : කොට්ටගහ ලියද්දේ වත්තේ අගලද යන මයිම් තුළ පිහිටා ඇති ඉඩමෙන් නොබෙදූ තුනෙන් දෙපංගුවද වේ.

අයකිරීමට තිබෙන මුදල රුපියල් 4,262.53 සහ 1964. 9. 20 දින සිට ගෙවන දින දක්වා සියයට 5 ගේ පොලියත් පිස්කල් ගාස්තු යනාදියත්.

ඒ. බී. රාජනායක,
වයඹ පළාතේ පිස්කල් වෙනුවට.

වර්ෂ 1966 ක්වූ නොවැම්බර් මස 6 දින,
කුරුණෑගල පිස්කල් කන්තෝරුවේ දීය.

11-633

---

## කුරුණෑගල දිස්ත්‍රික් නඩු ශාලාවේ දී ය

යායේගෙදර පදිංචි ඇම්. ඒ. ධර්මසේන ...........පැමිණිලිකාරයා.

නොම්මරය 1784/පී. එදිරිව

තුන්තිරිපිටිගම පදිංචිව සිට නැසීගිය ඇස්. ඇල්. අබ්දුල් මජීද්, බරිගෙඩ පදිංචි ජී. පොඩිනෝනා සහ තවත් අය......විත්තිකාරයෝ.

මෙහි පහත සඳහන්වෙන දේපලවලින් ඉහත කී නඩුවේ විත්තිකරුවන්ට තිබෙන අයිතිවාසිකම් සහ ප්‍රයෝජනයත් වර්ෂ 1966 ක්වූ දෙසැම්බර් මස 14 දින පස්වරු 3 ට ඉඩමේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ.

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ දේවමැදි හත්පත්තුවේ තිස්සව කෝරළේ තුත්තිරිපිටිගම පිහිටි කොලදූවිල වත්ත සහ කොලදූවිල හේන වර්ෂ 1964 ක්වූ ඔක්තෝබර් මස 8 වෙනි දින ජේ. එච්. ආර්. පෙරිප්පනායගම් මිනින්දෝරු තැන විසින් සාදන ලද අංක 656 දරණ ප්ලෑනේ "2" දරණ කැබැල්ල අක්කර 1, රූඩ් 2, පර්චස් 28 2/3, විශාල හරියට මායිම් :— උතුරට : වාරියපොල සිට හලාවතට යන මහ පාරද; නැගෙනහිරට : ලොට් "1" දරණ කැබැල්ලද; දකුණට : පී. ජී. කරුණාතිස්ට අයිති වත්ත ද; බස්නාහිරට : ගම්සභා පාර සහ මිනිපිටටහියද, මායිම් වූ ඉඩම සහ ඊට අයිති ගහ කොළ පලතුරු ආදී සියල්ලත් වේ.

අයකිරීමට තිබෙන මුදල රු. 473.07ක් සහ පිස්කල් ගාස්තු ආදියත් වේ.

ඒ. බී. රාජනායක,
වයඹ පළාත් පිස්කල් වෙනුවට.

වර්ෂ 1966.11.5,
කුරුණෑගල පිස්කල් කන්තෝරුවේ දීය.
11-631

---

## කුරුණෑගල ඉල්ලුම් නඩු ශාලාවේ දී ය

කඩවලගෙදර පදිංචි 1. හේරත් මුදියන්සෙලාගේ රංමැණිකා, කඩවලගෙදර පදිංචි 2. රත්නායක මුදියන්සෙලාගේ මුතු මැණිකා, කටගමුව පදිංචි 3. ධර්මකීර්ති ස්වාමීන් වහන්සෙ හා කඩවලගෙදර පදිංචි 4. රත්නායක මුදියන්සෙලාගේ පුංචි බණ්ඩා ........................................................ පැමිණිලිකරුවන්

නොම්මරය 2865/ඇම්බී එදිරිව

තිස්සව කෝරළේ හාතාපොල පදිංචි මිටියා දූරයලාගේ ගෙදර සිට්ටා ........................................................ විත්තිකාරයා.

මෙහි පහත සඳහන්වෙන දේපලවලින් ඉහත කී නඩුවේ විත්තිකරුට තිබෙන අයිතිවාසිකම් සහ ප්‍රයෝජනයත් වර්ෂ 1966 ක්වූ දෙසැම්බර් මස 12 දින ප. ව. 3 පැයට එකී ඉඩමේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ.

වෂී 1956 ක්වූ දෙසැම්බර් මස 15 වැනි දින ඇස්. ටී. ඒ. රාජපක්ෂ ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් සහතික කළ අංක 3,969 දරණ උගස් ඔප්පුව පිට විත්තිකරු විසින් පැමිණිලිකරුට උගස් කරණ ලදුව වෂී 1966 ක්වූ මාර්තු මස 23 වැනි දින නඩු තීන්දුවේ ප්‍රකාර සහ වෂී 1966 ක්වූ අගෝස්තු මස 9 වැනි දින දරණ විකිණීමේ නියෝගය ප්‍රකාර විකිණීමට නියම කර තිබෙන පහත සඳහන් දේපළ.

### උපලේඛනය

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දේවමැදි හත්පත්තුවේ තිස්සව කෝරළේ, හාතාපොල පිහිටි අක්කර් දෙකක් පමණ විශාල පට්ටියාවත්ත කියන ඉඩමට මායිම් :—

උතුරට : බඩියා වෙල් දූරයාගේ වත්තේ වැට; නැගෙනහිරට : සංගිට සහ තුවන් අයට අයිති වත්තේ වැට; දකුණට : බඩියා වෙල් දූරයාට සහ තුවන් අයට අයිති වත්තේ මායිම; බස්නාහිරට : හාතාපොල සිට කට්ටාපිටියට යන ගම්සභා පාර යන මායිම්තුළ පිහිටි ඉඩමෙන් සහ ඊට අයිති පලතුරු සහ සියලුදෙයින් නොබෙදූ දෙකෙන් එක පංගුව (1/2). ලියාපදිංචි කළ අංකය ඞී 389/206.

අයකිරීමට ඇති මුදල රු. 300 ක් හා 1966. 3. 23 වැනි දින සිට ගෙවනතුරු සියයට 5 බැගින් පොළිය, නඩු ගාස්තු රු. 75.85 ක් හා පිස්කල් ගාස්තු ආදිය.

ඒ.බී. රාජනායක,
වයඹ පළාතේ පිස්කල් වෙනුවට.

වෂී 1966 ක්වූ නොවැම්බර් මස 5 වැනි දින.
කුරුණෑගල පිස්කල් කන්තෝරුවේ දීය.
11-632

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනයද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස්වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් බාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පලකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට යැහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතුවන බව සලකත්වා.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් බාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.

### උපලේඛනය

### 1966

| මාසය | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|
| සැප්තැම්බර් | 66. 9. 2 | සිකුරාද | 66. 8.26 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 9. 9 | සිකුරාද | 66. 9. 2 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 9.16 | සිකුරාද | 66. 9. 9 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 9.23 | සිකුරාද | 66. 9.16 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 9.30 | සිකුරාද | 66. 9.23 | සිකුරාද | ප.ව. 3.30 |
| ඔක්තෝබර් | 66.10. 7 | සිකුරාද | 66. 9.30 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.10.14 | සිකුරාද | 66.10. 7 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.10.20 | බ්‍රහස්පතින්ද | 66.10.14 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.10.27 | බ්‍රහස්පතින්ද | 66.10.20 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| නොවැම්බර් | 66.11. 3 | බ්‍රහස්පතින්ද | 66.10.27 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | 66.11.10 | බ්‍රහස්පතින්ද | 66.11. 3 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | 66.11.18 | සිකුරාද | 66.11.10 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | 66.11.25 | සිකුරාද | 66.11.18 | සිකුරාද | දවල් 12 |
| දෙසැම්බර් | 66.12. 2 | සිකුරාද | 66.11.24 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | 66.12. 9 | සිකුරාද | 66.12. 2 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.12.16 | සිකුරාද | 66.12. 8 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | 66.12.23 | සිකුරාද | 66.12.16 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.12.30 | සිකුරාද | 66.12.22 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |

1966 ජූලි 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි